**විසි එක් වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය - 2013**

---

විසි එක් වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතියේ (HETC) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංස) අතර 2010 අගෝස්තු 26 දින එළඹි අංක 4686 - එල්කේ දරන ණය ගිවිසුමේ 2 ආ (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

---

විසි එක් වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සාධාරණ සමාජයීය හා ආර්ථික සංවර්ධන අවශ්‍යතා අරමුණු කරගත් ගුණාත්මක උසස් අධ්‍යාපන සේවා බෙදා හැරීම පිණිස ග්‍රාහකයාගේ උසස් අධ්‍යාපන පද්ධතිය, ආයතනයන් හා මානව සම්පත්වල ධාරිතාවය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. උසස් අධ්‍යාපන අංශය සඳහා වූ නියමයන් ආයතනගත කිරීම, ඉගැන්වීමේ හා ඉගෙනීමේ අදාළ බව හා ගුණාත්මක බව ප්‍රවර්ධනය කිරීම, විකල්ප උසස් අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම හා ශක්තිමත් කිරීම සහ මානව සම්පත් සංවර්ධනය, නියාමනය, ඇගයීම, අධ්‍යයන, සම්බන්ධීකරණය හා සන්නිවේදනය යනාදී වශයෙන් ප්‍රධාන සංරචක හතරකින් ව්‍යාපෘතිය සමන්විත වේ. ණය ගිවිසුම අනුව එජඩෝ මිලියන 40 ක් වූ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 නොවැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර, 2015 දෙසැම්බර් 31 වනවිට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්

අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම**

**-------------------------------------------**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන , ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීමට හැකිවන පරිදි පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම් , මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන මිලදී ගැනීම් හඳුනා

ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල් ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂයන්, ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(එ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද බන බව.

**3. මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය

සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයනලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද විගණනය නොකළ අතුරු මූල්‍ය වාර්තා (IUFR) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**4.1 මූල්‍ය කාර්ය සාධනය**

**-------------------------**

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති සංරචකයන්හි වියදම රු.874,456,231 ක් වූ අතර, 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.1,780,679,075 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම 2013 | 2012 | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **උසස් අධ්‍යාපන අංශය සඳහා නියමයන් ආයතනගත කිරීම** | | | |
| උසස් අධ්‍යාපන අංශය සඳහා ජාතික උසස් අධ්‍යාපන සුදුසුකම් රාමුවක් සංවර්ධනය කිරීම | 171,360 | 762,288 | 2,709,470 |
| සමස්ත උසස් අධ්‍යාපන අංශය සඳහා තත්ත්ව සහතික යාන්ත්‍රණ ස්ථාපිත කිරීම | 8,894,566 | 9,551,965 | 29,264,998 |
| **ඉගැන්වීමේ හා ඉගෙනීමේ තත්ත්වය ප්‍රවර්ධනය කිරීම** | | | |
| විශ්ව විද්‍යාල සංවර්ධන ප්‍රදාන | 319,305,073 | 206,152,021 | 562,301,115 |
| තත්ත්ව සහ නවෝත්පාදන ප්‍රදාන | 113,500,393 | 9,513,189 | 123,013,582 |
| **විකල්ප උසස් අධ්‍යාපනය ප්‍රසාරණය කිරීම හා ශක්තිමක් කිරීම** | | | |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතන වැඩසටහන් සහ කළමනාකරණය නවීකරණය කිරීම | 20,057,993 | 9,380,984 | 37,108,797 |
| උසස් තාක්ෂණික අධ්‍යාපනයට ප්‍රවේශවීමේ ප්‍රාදේශීය යුක්තිය ප්‍රවර්ධනය | 116,489,022 | 178,452,093 | 308,858,850 |
| **මානව සම්පත් සංවර්ධනය, නියාමනය, අධ්‍යාපන අධ්‍යයන, සම්බන්ධීකරණය සහ සන්නිවේදනය** | | | |

| | | | |
|---|---|---|---|
| අධ්‍යයන, කළමනාකාරිත්ව සහ තාක්ෂණික කාර්ය මණ්ඩලයන්හි මානව සම්පත් සංවර්ධනය | 124,013,690 | 115,469,828 | 272,137,517 |
| ප්‍රතිපත්ති අධ්‍යයන, පර්යේෂණ, නියාමනය, ඇගයීම, සම්බන්ධීකරණය සහ සන්නිවේදනය | 172,024,134 | 126,351,924 | 445,284,746 |
| එකතුව | 874,456,231 | 655,634,292 | 1,780,679,075 |

## 4.2 විශේෂ (ඩොලර්) ගිණුම

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව ව්‍යාපෘතියේ (විසිඑක් වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය) අරමුණ සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් නමින් විශේෂ (ඩොලර්) ගිණුමක් (උප ලෙජර් ගිණුම් අංක 154 ) ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) විවෘත කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමේ මෙහෙයුම් පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 2,494,438 | 317,194,719 |
| එකතු කළා : | | |
| ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් ඌන පූරණය කිරීම් | 8,680,987 | 1,124,091,268 |
| විදේශ මුදල් ප්‍රත්‍යාගණනය | - | 9,708,815 |
| අඩු කළා: | | |
| ආපසු ගැනීම් | 6,516,872 | 841,874,969 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 4,658,553 | 609,119,833 |

## 5. විගණන නිරීක්ෂණය

----------------------

කුලී පදනම මත යොදවාගෙන තිබූ වාහන දෙකක් සඳහා එකතුව රු.1,440,000 ක් වූ කුලී ගාස්තු සමාලෝචිත වර්ෂය තුළදී දරා තිබුණි. කෙසේ වුවද අදාළ වාහන ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා යොදාගත් බවට තහවුරු කර ගැනීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

## 6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------

### 6.1 අරමුදල් උපයෝජනය

-----------------------

අරමුදල් මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් තථ්‍ය උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

<u>අරමුදල් උපයෝජනය</u>

| ප්‍රභවයන් | ණය ගිවිසුමේ මූල්‍යායනය කිරීම සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | 2013 වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් | | අරමුදල් උපයෝජනය ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | |
| ජා සං සං | 40 | 4,650 | 890 | 841.87 | 14.06 | 1,780.68 | 38 |
| එකතුව | 40 | 4,650 | 890 | 841.87 | 14.06 | 1,780.68 | |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත තොරතුරු අනුව, ව්‍යාපෘති කාල පරිච්ඡදය සියයට 61 ක් ඉක්ම වූ පසුවද ප්‍රතිපාදිත අරමුදල්වලින් සියයට 38 ක් පමණක් උපයෝජනය කර තිබූ බව අනාවරණය විය. කඩිනම් වැඩසටහනක් ක්‍රියාත්මක නොකෙරේ නම් ඉතිරි ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී සැලසුම් කරන ලද වැඩ සම්පූර්ණ කිරීමට නොහැකි වනු ඇත.

(ආ) පහත විස්තර දැක්වෙන පරිදි අනෙකුත් සංරචකයන් යටතේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ සතුටුදායක ප්‍රගතියක් පෙන්වා නොතිබුණි.

| විස්තරය | වෙන්කිරීම | 2013 වර්ෂය සඳහා තථ්‍ය වියදම | අරමුදල් උපයෝජනය |
|---|---|---|---|
| | රු. | රු. | ප්‍රතිශතය |
| උසස් අධ්‍යාපන අංශය සඳහා ජාතික උසස් අධ්‍යාපන සුදුසුකම් රාමුවක් සංවර්ධනය කිරීම | 650,000 | 171,360 | 26 |
| සමස්ථ උසස් අධ්‍යාපන අංශය සඳහා තත්ත්ව සහතික යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම | 53,756,000 | 8,894,566 | 16 |
| තත්ත්ව හා නවෝත්පාදන ප්‍රදාන (Q1G) | 250,510,063 | 113,500,393 | 45 |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණික ආයතන වැඩසටහන් නවීකරණය සහ කළමනාකරණය | 90,000,000 | 20,057,993 | 22 |

(ඇ) i උසස් අධ්‍යාපනය පිළිබඳ ආර්ථික අදාළත්වය සංවර්ධනය කිරීම සඳහා සියළුම විශ්ව විද්‍යාල වලට විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදාන සහාය වේ. වර්ෂ 4 සඳහා කරන ලද ප්‍රතිපාදනයෙන්, උපයෝජනය කළ යුතු අවම ඉලක්කය සියයට 75 ක් වුවත් 2013 වර්ෂය අවසානය දක්වා විශ්ව විද්‍යාල හයක් විසින් සියයට 40 කට වඩා අඩුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.

ii බාහිර උපාධි වැඩසටහන් යටතේ වර්ෂ 4 සඳහා කරන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ යුතු අවම ඉලක්කය සියයට 50 ක් වුවත් 2013 වර්ෂය අවසානය දක්වා විශ්ව විද්‍යාල 12 ක් විසින් සියයට 40 කට අඩු ප්‍රමාණයක් ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.

## 6.2 භෞතික කාර්ය සාධනය

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උසස් අධ්‍යාපන අංශය සඳහා ආයතනගත නියමයන් සංරචකය යටතේ ජාතික සුදුසුකම් රාමුවක් සංවර්ධනය කිරීම හා ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අංශයේ ආයතනගත රාමුවක් සඳහා තත්ත්ව සහතික ක්‍රමයක් ස්ථාපිත කිරීමට අදාළ කාර්යයන් 2012 වර්ෂය අවසාන වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂා කර තිබුණි. 2013 අප්‍රේල් 22 දිනැති චක්‍රලේඛ අංක 5/2013 යටතේ විශ්ව විද්‍යාල ප්‍රධානීන් සඳහා නිකුත් කරන ලද උපදෙස් මගින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ජාතික සුදුසුකම් රාමුවක් හඳුන්වා දී ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වුවද ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ (SLIATE ) විෂය පථය යටතේ වන ආයතනයන්ට ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය විසින් නිකුක් කළ යුතු සමාන චක්‍රලේඛ උපදෙස් 2014 අප්‍රේල් 30 වන විටත් නිකුත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය (SLIATE ) නවීකරණය සඳහා ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ නවීකරණ වැඩසටහන් යටතේ නායකත්ව හා තත්ත්ව සංවර්ධන මධ්‍යස්ථානය (**LQDC** ) ස්ථාපනය කිරීමට 2014 අප්‍රේල් 30 වන විටත් කටයුතු ආරම්භ කර නොතිබුණි.

ii වවුනියාවේ උසස් තාක්ෂණික ආයතනය සඳහා 2013 මැයි 13 ට පෙර සම්පූර්ණ කළ යුතු නව ගොඩනැගිල්ලක ඉදිකිරීම් වැඩ 2014 අප්‍රේල් 30 වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. තවද රත්නපුර හා තංගල්ල හි අභිනවයෙන් ස්ථාපනය කරන ලද උසස් තාක්ෂණික ආයතනයන්හි අධ්‍යාපන වැඩ සටහන් 2013 වර්ෂය අවසානයේදී ආරම්භ කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ නිම කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් එම කාර්යයන් සැලසුම් කළ පරිදි ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) උසස් අධ්‍යාපන අංශයේ මානව සම්පත් ශක්තිමත් කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය, නියාමනය හා ඇගයීම, අධ්‍යයන හා සන්නිවේදන සංරචකය යටතේ ව්‍යාපෘතිය විසින් විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන්ට උසස් අධ්‍යයනයන් සඳහා ප්‍රදාන ලබා

දී තිබුණි. ඉහත සංරචකය යටතේ විශ්ව විද්‍යාල 05 ක ප්‍රදාන ලබාගත් කථිකාචාර්යවරුන් 06 දෙනෙකු විසින් 2013 වර්ෂයේදී අධ්‍යයන කටයුතු සම්පූර්ණ කළ යුතු වුවද , 2014 අප්‍රේල් 30 වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.

(ඈ) ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණය පිළිබඳව උපාධි අපේක්ෂකයින්ගේ කුශලතා ඉහළ දැමීම සඳහා රු.8,543,252 ක පිරිවැයකට වැඩ සටහනක් දියත් කරන ලදී. කෙසේ වුවද එම පරීක්ෂණ සඳහා සුදුසුකම් ලැබූ උපාධි අපේක්ෂකයින් 7471 කගෙන් උපාධි අපේක්ෂකයින් 2177 ක් පමණක් කථනය පරීක්ෂණ (Speaking Tests ) වලට පෙනී සිටි අතර උපාධි අපේක්ෂකයින් 1699 ක් අදියර 4 ම සුදුසුකම් ලබා තිබූ බව නිරීක්ෂණය විය.

**6.3 මතභේදයට තුඩුදෙන කරුණු**

**-----------------------------------**

ව්‍යාපෘතියේ සේවා කාලය වර්ෂ තුනක් සම්පූර්ණ වූ විගසම සේවයෙන් ඉවත් වූ සේවකයන් 4 දෙනෙකුට එකතුව රු. 386,818 ක් වූ පාරිතෝෂික දීමනා, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ විධිවිධාන වලට පටහැනිව ගෙවා තිබුණි.